# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2132/21 – 2019 ජූලි 19 වැනි සිකුරාදා – 2019.07.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වන අනු ව්‍යවස්ථාව සමග කියවිය යුතු 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශෙෂ විධිවිධාන) පනත මගින්සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ වගන්තිය (4) වැනි උපවගන්තිය මගින්මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මාගේ මේ නියමය මගින්,

(අ) 1982 අංක 5, 1988 අංක 20, 1999 අංක 30, 2002 අංක 23, 2003 අංක 32 දරන පනත්වලින් සංශෝධිත 1979 අංක 17 දරන පනත් මගින් පිහිටුවන ලද ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා දී ඇත්තා වූ මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තර ලෙස දක්වා ඇති බලයලත් මිනින්දෝරු රණසිංහ තාඹුගල මහතා විසින් 1983.09.30 දින මැන සකස් කරන ලද ගම් 148 දරන පිඹුරෙන් නිරූපිත අක්කර 282 රූඩ් 02 පර්චස් 28 ක් වූ 1986 මැයි 30 දින අංක 403/18 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද එකී ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ වගන්තියේ (1) වන උප වගන්තිය ප්‍රකාරව පවරා දෙන ලද පොකුණුවල වත්ත හෙවත් රන් පොකුණ වත්ත ඉඩම වේ.

(ආ) මෙහි පළමු උපලේඛනයේ සවිස්තර ලෙස දක්වා ඇති එකී ඉඩම තුළට ඇතුළත් බවට හඳුනාගෙන ඇති 2 වන උපලේඛනයේ සවිස්තර ලෙස දක්වා ඇති පොකුණුවල වත්ත හෙවත් රන් පොකුණ වත්ත ඉඩමට අදාළ, කෝසල සමිත් ලියනගේ මහතා හිමිකම් කියන අක්කර 01 රූඩ් 01 පර්චස් 11 ක පුද්ගලික ඉඩම් කොටස අවසතු කිරීම සඳහා වූ එකී නියමයන් ප්‍රත්‍යාදිෂ්ට කිරීම මගින් එම නියමය මෙයින් සංශෝධනය කරමි.

මෙකී ප්‍රත්‍යාදිෂ්ට කිරීමෙන් පසුව මෙහි දෙවන උපලේඛනයේ සවිස්තර ලෙස දක්වා ඇති එකී ඉඩමේ බිම් ප්‍රමාණය ඉඩමේ මුල් හිමිකරු වෙත නැවත සතුවන බවට මෙයින් ප්‍රකාශ කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2019 ජූලි මස 02 වැනි දින.
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## පළමුවන උපලේඛනය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා දී ඇති රන්පොකුණ වත්ත හෙවත් පොකුණුවල වත්ත නම් ඉඩමේ විස්තර:

| ගැසට් නිවේදනයේ විස්තර | ඉඩමේ නම | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පිඹුරු අංකය | නිවාස සංවර්ධන අධිකාරිය වෙත දී ඇති ඉඩම් ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | අක්කර | රූඩ් | පර්චස් |
| 1986 මැයි 30 වැනි දින අංක 403/18 | පොකුණුවල වත්ත හෙවත් රන්පොකුණ වත්ත | ගම්පහ | අත්තනගල්ල | ගම්/148 | 282 | 2 | 28 |

## දෙවන උපලේඛනය

අවසතු කරනු ලබන ඉඩම් කොටසේ විස්තර:

| වෙන්කර දී ඇති විශේෂ අංකය | ඉඩමේ නම | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පළමුවන උපලේඛනයේ සඳහන් සම්පූර්ණ ඉඩමෙන් කොමිෂන් සභාව වෙත පැවරෙන ඉඩම් කොටස |
|---|---|---|---|---|
| කො/2317 | පොකුණුවල වත්ත හෙවත් රන්පොකුණ වත්ත | ගම්පහ | අත්තනගල්ල | බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වතුපිටිවල ගමේ පිහිටි ගම්/148 දරන පිඹුර මගින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත 1986.05.30 දින අංක 403/18 අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් ලබාදී ඇති අක්කර 282 රූඩ් 02 පර්චස් 28 ක ප්‍රමාණය තුළ පිහිටි පුද්ගලික ඉඩම් කොටසවන බලයලත් මිනින්දෝරු ඒ. එම්. බී. මුදියන්සේ මහතා විසින් 2018.06.25 දින ඇඳ අධිෂ්ඨාපනය කරන ලද 1388 දරන පිඹුරෙන් (කැබලි අංක 1, 2, 3, 5 න් නිරූපිත අක්කර 01 රූඩ් 1 පර්චස් 11 ක්) හෙක්. 0.53371 ක ප්‍රමාණයට මායිම්:<br><br>**කැබලි අංක 01 – (කුඹුර) – ප්‍රමාණය: අක්කර 01 රූඩ් 0 පර්චස් 18.0**<br>උතුරට: ගම් 148 හි කැබලි අංක 1; නැගෙනහිරට: ඇළ; දකුණට: පීලිස් අප්පු හිමිකම් කියන ලද දැනට එල්. ලියනගේ හිමිකම් කියන කුඹුර; බටහිරට: ගම් 148 හි කැබලි අංක 1.<br><br>**කැබලි අංක 02 – (ඕවිට) – ප්‍රමාණය: අක්කර 00 රූඩ් 0 පර්චස් 27.0**<br>උතුරට: ගම් 148 හි කැබලි අංක 1; නැගෙනහිරට: මෙම පිඹුරේ කැබලි අංක 3, 4, 5, මාර්ගය සහ ගම් 148 හි කැබලි අංක 1; දකුණට සහ බටහිරට: ඇළ.<br><br>**කැබලි අංක 03 – (මාර්ගය) – ප්‍රමාණය: අක්කර 00 රූඩ් 0 පර්චස් 03**<br>උතුරට සහ නැගෙනහිරට: මාර්ගය; දකුණට: මෙම පිඹුරේ කැබලි අංක 4; බටහිරට: මෙම පිඹුරේ කැබලි අංක 2.<br><br>**කැබලි අංක 05 – (මාර්ගය) – ප්‍රමාණය: අක්කර 00 රූඩ් 0 පර්චස් 03**<br>උතුරට: මෙම පිඹුරේ කැබලි අංක 4; නැගෙනහිරට: මාර්ගය; දකුණට: ගම් 148 හි කැබලි අංක 1; බටහිරට: මෙම පිඹුරේ කැබලි අංක 2. |



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.